ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 10.05.2021. |

පැමිණිලි පාර්ශවය : එල්.එම්.ඒ.එම්.ලංකාධිකාර මහතා,
අංක : 112, ඇතිමලේ වැව,
මොණරාගල.

පැමිණිලි පාර්ශවය :

1. ඒ.පී.ධම්මික වීරසේකර මහතා,
පොලිස් අධිකාරි,
පොලිස් අධිකාරි කාර්යාලය,
බදුල්ල.

2. බී.ඒ.ඩී.බාලසූරිය මහතා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
ලුණුගල.

3. රොෂාන් රාජපක්ෂ මහතා,
සහකාර පොලිස් අධිකාරි, දිස්ත්‍රික් II,
සහකාර පොලිස් අධිකාරි කාර්යාලය,
බදුල්ල.

4. පො.ප. ජී.ඩී.රත්නපාල මහතා,
පොලිස් ස්ථානය,
මඩොල්සිම.

5. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය,
බදුල්ල.

පැමිණිලි අංකය . HRC/1565/18

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා 2018.06.10 වන දින ලුණුගල පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදී පොලිස් ස්ථානයේ එවකට වැඩ බලන ස්ථානාධිපති ලෙස කටයුතු කළ පො.ප. රත්නපාල නැමති නිලධාරියා විසින් තමාට 2018 මාර්තු මස දිනක සිදුකළ ලිංගික අඩම්තේට්ටම් සහ හිංසනයන් පිළිබඳව ස්ථානාධිපතිවරයාට 2018 මාර්තු මස 15 වන දින පැමිණිලි කළ බවත්, එය තහවුරු කිරීම සඳහා පො.ප. රත්නපාල මහතා විසින් ඔහුගේ දුරකථන අංකය මඟින් 2018.03.05 වන දින එවන ලද කෙටි පණිවිඩ ද ස්ථානාධිපතිගේ දුරකථනය වෙත යොමු කළ බවත්, පසුව සහකාර පොලිස් අධිකාරි වෙත ද පැමිණිලි කළ බවත්, එම පැමිණිල්ල විභාග කිරීමක් සිදු නොවූ බවත්ය. තවද, පො.ප.රත්නපාල නැමති නිලධාරියාට ලබාදී තිබූ ස්ථාන මාරුව සම්බන්ධයෙන් අභියාචනයක් කර තිබූ අතර, ඒ පිළිබඳව තමාගෙන් ප්‍රකාශයක් ලබාගත් බවත්, එම ප්‍රකාශය ලබාගැනීමෙන් අනතුරුව තමාව 2018.07.06 වන දින හාලිඇල පොලිස් ස්ථානයට ස්ථාන මාරුකළ බවත්, පසුව 2018.08.01 වන දින නුවරඑළිය කොට්ඨාශය වෙත රාජකාරි අවශ්‍යතාවය මත යැයි පවසා නැවත ස්ථාන මාරුවක් ලබාදුන් බවත් සඳහන් කර ඇත.

තමා විසින් සිදුකළ පැමිණිල්ලෙන් පසුව තමාට මෙම ස්ථාන මාරුවීම් ලබාදීම නිසා තමාට අසාධාරණයක් සිදුවූ බවත්, එය සිදුවූයේ තමාට සිදුවූ හිරිහැර සම්බන්ධයෙන් සහනයක් ඉල්ලා පැමිණිලි කිරීම නිසා බවද, ඒ පිළිබඳව අමාත්‍යංශ ලේකම්වරයා වෙත පැමිණිලි කිරීමෙන් අනතුරුව මේවනවිට තමාට මොණරාගල ප්‍රදේශය වෙත ස්ථාන මාරුවක් ලබාදී තිබෙන බවත් සඳහන් කර ඇත. පැමිණිල්ලෙන් පැමිණිලිකරු බලාපොරොත්තු වන්නේ තමාට සිදුවූ ලිංගික හිංසනය සම්බන්ධයෙන් තමා කරනු ලැබූ පැමිණිල්ල විමර්ශනය නොකර ඊට අදාළ නිත්‍යානුකූල කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සහනයක් ලබාගැනීම සහ තමා වෙත ලබාදුන් ස්ථාන මාරුවීම් වලින් ද තමාට අසාධාරණයක් සිදුව ඇති බැවින් ඒ සඳහා සහනයක් ලබාදෙන ලෙසට වේ.

තවද, තමා කළ පැමිණිල්ල සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරි රොෂාන් රාජපක්ෂ මහතා විසින් තමාගෙන් ප්‍රකාශයක් ලබාගෙන ඒ පිළිබඳව වාර්තාවක් බදුල්ල කොට්ඨාශ භාර පොලිස් අධිකාරි ධම්මික වීරසේකර මහතාට ලබාදී ඇති බවට දැනගැනීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතිය තොරතුරු දැනගැනීමේ පනත මඟින් ලබාගැනීම සඳහා බදුල්ල පොලිස් කොට්ඨාශයේ තොරතුරු නිලධාරියා වෙතින් අයදුම්පතක් ලබාගෙන එම අයදුම්පත 2018.07.01 වන දින ෆැක්ස් මඟින් සහ 2018.07.02 වන දින තැපැල් මඟින් යොමු කරනු ලැබූ බවද සඳහන් කර ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තමා මෙම පැමිණිල්ල සිදුකිරීමෙන් පසුව තමා වෙත 2019.07.31 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් අපකීර්තිදායක හැසිරීම, අණට අකීකරුවීම සහ විශ්වාසය කඩකිරීම යටතේ චෝදනා පත්‍රයක් ගොනුකර ඇති බවයි. ඊට හේතු සාධක ලෙස, පො.ප.රත්නපාල නිලධාරියාගෙන් සිදුවූ අතවර පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවට වෙනත් ආයතන සහ මාධ්‍ය ආයතන වෙතට සාවද්‍ය තොරතුරු අවසරයකින් තොරව තමාගේ අභිමතය පරිදි ලබාදීම බව චෝදනා පත්‍රයේ සඳහන් කර ඇති බවට දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

<u>දෙවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2018.12.21 වන දින විමර්ශනයක් සිදුකර ඇති අතර, ඒ සඳහා ලුණුගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පො.ප. බී.ජී.ඩී.බාලසූරිය මහතා පෙනීසිට ඇත. ඒ මහතා ප්‍රකාශ කර ඇත්තේ, 2018.03.15 වන දින තමා පස්යාල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්තක් සඳහා සහභාගී වූ බවත්, එම නඩු කටයුත්ත අවසන්වී ස්ථානයට පැමිණි අවස්ථාවේදී පැමිණිලිකාර ලංකාධිකාර නිලධාරියා තම රාජකාරි ජංගම දුරකථනයට ඇමතුමක් ලබාදී ගෙදර යාමට අවශ්‍ය බව පවසා ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙසට ඉල්ලීම් කළ බවත්, එවිට තමා අනුමැතිය ලබාදුන් බවත්ය. පසුව මෙම නිලධාරියා එදින රාත්‍රියේ ඇමතුමක් ලබා දී තමාට පො.ප.රත්නපාල නිලධාරියා එළියට යාමට කථා කරන බවත්, ඒ අනුව ලංකාධිකාර නිලධාරියා ඊට අදාළ SMS පණිවිඩ ද තමාගේ දුරකථනය වෙත යොමු කළ බවත්, එම පණිවිඩ වල ලිංගික හිංසනයක් පිළිබඳව අවබෝධයකට පැමිණිය නොහැකි නමුත් එය විනය විරෝධී ක්‍රියාවක් බැවින් ඒ අනුව එදිනම සහකාර පොලිස් අධිකාරිවරයා වෙත මේ පිළිබඳව වාර්තා කළ බවත්, ඔහුගේ උපදෙස් මත පොලිස්පති කාර්යාලයට ද ඒ සම්බන්ධයෙන් වාර්තා කළ බවත්, ඉන්පසුව සිද්ධිය සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරි වෙත වාර්තාවක් ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත. එම වාර්තාව පිළිබඳව පො.ප. රත්නපාල මහතා දැනගෙන තිබූ බවත්, ඉන්පසුව එම නිලධාරියා විසින් තමාට විරුද්ධව සිද්ධියක් නිර්මාණය කර චෝදනා කිරීම සම්බන්ධයෙන් විවිධ ස්ථාන වලට පැමිණිලි යොමු කර තිබූ බවත් සඳහන් කර ඇත.

තවදුරටත් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, මේ පිළිබඳව වැඩිදුරටත් සොයා බැලීමේදී මෙම පැමිණිලිකරු පමණක් නොව පොලිස් ස්ථානයේ සිටි නිරෝජන් නැමති නිලධාරියා ද, පොලිස් ස්ථානයේ සේවය කළ කම්කරුවෙකු ද මෙම පො.ප. රත්නපාල නැමති නිලධාරියාගෙන් හිංසනයට ලක්වී තිබූ බවට අනාවරණය වූ බැවින්, ඒ පිළිබඳව අදාළ නිලධාරින්ව දැනුවත් කළ බවයි.

තුන්වන වගඋත්තරකාර සහකාර පොලිස් අධිකාරි රොෂාන් රාජපක්ෂ මහතාගේ කරුණු දැක්වීම :-

මේ සම්බන්ධයෙන් තුන්වන වගඋත්තරකරු වශයෙන් සහකාර පොලිස් අධිකාරි රොෂාන් රාජපක්ෂ මහතා කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එම වාර්තාවේ සඳහන් වන්නේ ලුණුගල පොලිස් ස්ථානාධිපති පො.ප. බාලසූරිය නිලධාරි විසින් 2018.03.16 දිනැතිව පො.ප.රත්නපාල නිලධාරියා සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරමින් පොලිස් ස්ථානයේ සිටින තරුණ නිලධාරියෙකුට රාජකාරිමය වශයෙන් බලපෑම් සිදුකර අයුතු යෝජනා කරන බවට සඳහන් කර තිබූ බවයි. අයුතු බලපෑම් සිදුකරන්නේ කාටද යන්න හෝ සිදුකරන ආකාරය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර නොමැති අතර, SMS කෙටි පණිවිඩ වල ඡායා පිටපත් සමග වාර්තාවක් තමා වෙතින් පොලිස් අධිකාරිතුමා වෙත යොමු කිරීමට තමාගේ කාර්යාලයට යොමු කර තිබූ බවත්, එම වාර්තාව තමා විසින් පොලිස් අධිකාරිවරයා වෙත අවශ්‍ය කටයුතු සහ උපදෙස් සඳහාද, නියෝග සඳහාද 2018.03.25 වන දින යොමු කරන ලද බවත් දක්වා ඇත. එසේම පො.ප. බාලසූරිය සහ පො.ප. රත්නපාල අතර ජ්‍යෙෂ්ඨත්වය මත යම් යම් ගැටළු තිබූ බව දැනගැනීමට තිබූ බැවින් එම කරුණු ද, ස්ථානාධිපති - ලුණුගල විසින් පො.ප. රත්නපාල සම්බන්ධයෙන් යොමු කර තිබූ වාර්තාව ද සැළකිල්ලට ගෙන පොලිස් අධිකාරිතුමා වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව පො.ප. රත්නපාල මහතා මඩොල්සිම පොලිස් ස්ථානය වෙත ස්ථාන මාරු කරන ලද බව සඳහන් කර ඇත.

තවද, පො.ප. රත්නපාල නිලධාරියා විසින් 2018.03.27 දාතමින් යුතුව හදිසි ස්ථාන මාරුව අවලංගු කර ගැනීම යටතේ ඉදිරිපත් කර තිබූ අභියාචනය අනුව පොලිස් අධිකාරි ධම්මික වීරසේකර මහතා විසින් තමා වෙත එම අභියාචනය සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකරන ලෙසට ලබාදී තිබූ නියෝගය අනුව මූලික විමර්ශන කටයුතු ආරම්භ කරන ලද බවත්, එම මූලික විමර්ශන කටයුතු සඳහා පො.ප. රත්නපාල නිලධාරියා කැඳවා ගැනීමට උත්සාහ කළ ද, දීර්ඝ අසනීප නිවාඩු වාර්තා කර තිබූ බැවින් පො.ප. බාලසූරිය නිලධාරියාගෙන් 2018.04.27 වන දින කාර්යාලයට කැඳවා ප්‍රකාශයක් සටහන් කර ගත් බවත් සඳහන් කර ඇත. ස්ථානාධිපති ලුණුගල විසින් මීට පෙර පො.ප. රත්නපාල නිලධාරියා සම්බන්ධයෙන් තමා මඟින් පොලිස් අධිකාරි වෙත වාර්තාවක් යොමු කර තිබූ බැවින්, එම වාර්තාව සමඟ SMS කෙටි පණිවිඩ පිටපත් ද පොලිස් අධිකාරි කාර්යාලයෙන් තමා වෙත ලැබී තිබූ බැවින් තමා ස්ථානාධිපති ලුණුගල වෙතින් ඒ සම්බන්ධයෙන් විමසීමක් සිදුකරන ලද බව සඳහන් කර ඇත.

පො.කො.ලංකාධිකාරි නිලධාරියා තමාට පො.ප.රත්නපාල නිලධාරියාගෙන් සිදුවූ බවට පවසන බලපෑම් පිළිබඳව ලුණුගල පොලිස් ස්ථානයේ කිසිදු තොරතුරු සටහන් පොතක සටහන් දැමීමක් හෝ උසස් නිලධාරියෙකුට පැමිණිලි කිරීම හෝ සහෝදර නිලධාරියෙකුට පැවසීමක් සිදුකර නොමැති අතර, එසේම උපසේවා භාර නිලධාරියාට ද කාර්ය භාර නිලධාරියාට ද දැනුම්දීමක් සිදුකර නොතිබූ බවට ද සඳහන් කර ඇත. එසේම, මෙම නිලධාරියා විසින් පොලිස්පතිතුමාට, පොලිස් කොමිෂන් සභාවට සහ මානව හිමිකම් කොමිෂන් සභාවට මෙම පැමිණිල්ල සිදුකර තිබූ අතර, මෙම අපරාධය හෝ අපරාධයට පොළඹවා ගැනීම සිදුකරන අවස්ථාවේදී ඒ පිළිබඳව පැමිණිල්ලක් නොකිරීම හෝ උසස් නිලධාරියෙකුට

පැමිණිලි කිරීමට පියවර නොගැනීම පිළිබඳව පොලිස් පරීක්ෂක බාලසූරිය සහ පො.ප. රත්නපාල නිලධාරියා අතර පවතින මත ගැටුම් සඳහා අතරමැදියෙකු ලෙස කටයුතු කළද, නොඑසේ නම් මෙය සත්‍ය වශයෙන් සිදුවූවාද යන්න විමර්ශන නිලධාරියෙකුට ගැටළු සහගත තත්ත්වයක් බැවින් මේ පිළිබඳව අවධානය යොමු කර විමර්ශන කටයුතු සිදුකළ යුතු බවත්, තිබෙන රාජකාරි බහුලත්වය මත වුවද නිලධාරියාගේ ප්‍රකාශයේ සඳහන් කරුණු වලට අනුව අපක්ෂපාති පරීක්ෂණයක් සිදුකිරීමට පියවර ගන්නා ලද බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස මේවනවිටත් පො.ප. රත්නපාල නිලධාරියාට එරෙහිව 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 345 වන වගන්තියේ සඳහන් ලිංගික අතවර කිරීමේ වරද සඳහා පස්සර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 17508 යටතේ අධිකරණය වෙත කරුණු වාර්තා කරන ලද බවත්, එම නඩුව විභාග වෙමින් පවතින බවත් සඳහන් කර ඇත.

එසේම, 2018.05.11 වන දින ලංකාධිකාර නිලධාරියා කැඳවා ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, එම ප්‍රකාශයේ ඔහු විසින් සඳහන් කර ඇත්තේ, "තමා පාලන අංශයේ සිටින විට පො.ප. රත්නපාල මහතා තමාගෙන් "අදවත් අංජුලගෙ ගෙදර යමුද, බැරිනම් ලුණුගල තානායමට හරි යමුද, මට ඒකේ කාමරයක් තියෙනවා, අපි දෙන්නට තනියම කථා කර කර ඉන්න පුළුවන්" කියා කියූ බවත්, තමාගේ පුරුෂ ලිංගය අතගෑ බවත්, මේ සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි නොමැති බවත්, පො.ප. රත්නපාල නිලධාරියා විසින් එම ක්‍රියාව සිදුකරන ලද දිනය හෝ වේලාව මතක නැති බවත්, මෙසේ දින 05 ක් පමණ සිදුකළ බවත්ය." එසේම තමාට අංජුල යන අය තර්ජනය කළ බවට ඇතුළත් හඬ පටිගත කරන ලද සීඩී තැටියක් ද ඉදිරිපත් කරමින් ප්‍රකාශයක් ලබාදුන් බවද දක්වා ඇත. එහිදී අපරාධය සිදුවූ දිනය හෝ වේලාව මතක නැති බවට සඳහන් කිරීම තුළින් පොලිස් නිලධාරියෙකු වශයෙන් ඔහුට මෙම අපරාධය තුළින් සිදුවූ බලපෑම කුමන ආකාරයෙන් සිදුවූවාද යන්න ගැටළු සහගත බවද, ඒ අනුව මෙම ලංකාධිකාර නිලධාරියගේ ප්‍රකාශය සැකයට භාජනය වන බව ද සඳහන් කර ඇත. කෙසේ වුවද පො.කො. 91769 නිරෝජන් සහ කාර්යාල සේවක නිමල් ඉෂාර රත්නායක යන අයවළුන්ද කැඳවා ප්‍රකාශ ලබාගෙන ඇති අතර, ලුණුගල පොලිස් ස්ථානයේ මැතිවරණ කටයුතු සඳහා කම්කරුවෙක් ලෙස තාවකාලිකව බඳවා ගෙන සිටි ප්‍රියංකර මහේෂ් යන අයගේ ප්‍රකාශයක් ද සටහන් කළ බව සඳහන් කර ඇත. ඒ අනුව ගොනුව පොලිස් අධිකාරිතුමා වෙත යොමු කරන ලද අතර, කොට්ඨාශ අපරාධ විමර්ශන අංශය මගින් වැඩිදුර විමර්ශනයක් සිදුකිරීමට යෝජනා කරමින් කොට්ඨාශ භාර පොලිස් අධිකාරි ධම්මික වීරසේකර මහතා වෙත යොමු කළ බවද, කොට්ඨාශ භාර පොලිස් අධිකාරි ධම්මික වීරසේකර මහතා නීතිමය පියවර ගැනීම සඳහා තමා වෙත උපදෙස් ලබාදුන් බව ද සඳහන් කර ඇත.

තවද, පොලිස් අධිකාරි ධම්මික වීරසේකර මහතා කිසි දිනක පො.ප.රත්නපාල මහතාට විරුද්ධව කටයුතු නොකරන ලෙසට තමා වෙතට උපදෙස් දීමක් සිදුනොකළ බවද, එසේ සිදුකළ බවට පැමිණිලි කිරීම සත්‍යයෙන් තොර බවද එහි සඳහන් වේ. තවද, මෙම සිද්ධියට අදාළව මේවනවිට පස්සර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 17508 යටතේ නඩුවක් විභාග වන බව ද, ඒ අනුව මෙම සිද්ධිය

සම්බන්ධයෙන් අදාළ සියළුම විනය පියවර ගෙන ඇති බවද පැමිණිලිකාර ලංකාධිකාර නිලධාරියාට කිසිදු ආකාරයකින් අසාධාරණයක් සිදුකර නොමැති බවද දක්වා ඇත.

තවද, වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ මෙම පැමිණිලිකාර ලංකාධිකාර නිලධාරියාව 2018.05.11 වන දින කැඳවා ප්‍රකාශයක් ලබාගන්නා තෙක් ඔහු විසින් කිසිදු පැමිණිල්ලක් තමා වෙත වාචිකව හෝ ලිඛිතව සිදුකර නොතිබූ බවයි. නමුත්, පො.ප. රත්නපාල නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයට අනුව තමා විසින් කරන ලද මූලික විමර්ශනයේදී පො.කො. ලංකාධිකාර නිලධාරියාගෙන් ලබාගත් ප්‍රකාශය අනුව විමර්ශනයක් සිදුකළ බවත්, එහිදී ඔහුට යම් අපරාධයක් හෝ අසාධාරණයක් සිදුව ඇත්ද යන්න පිළිබඳව සොයාබැලීමක් සිදුකර එසේ වී නම් ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ගයක් තුළින් අදාළ අයට දඬුවම් ලබාදීමට හැකි වන ආකාරයෙන් කටයුතු කළ බවත් දක්වා ඇත. වගඋත්තරකරු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමා විසින් සාධාරණ පරීක්ෂණයක් සිදුකළ බවත්, එය කිසිදු ප්‍රමාදයකින් තොරව සිදුකළ බවත්, ඒ අනුව තමා විසින් අවශ්‍ය පියවර ගෙන ඇති අතර, මෙම අයට කිසිදු අසාධාරණයක් සිදු නොකළ බවත්ය.

<u>පළවන වගඋත්තරකාර පොලිස් අධිකාරි ඒ.පී.ධම්මික වීරසේකර මහතාගේ කරුණු දැක්වීම :-</u>

පළවන වගඋත්තරකරු වන පොලිස් අධිකාරි ඒ.පී.ඩී.වීරසේකර මහතා කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටිමින් ප්‍රකාශ කර ඇත්තේ, පො.කො. ලංකාධිකාර නිලධාරියා ලුණුගල පොලිස් ස්ථානයේ රාජකාරියේ නිරතව සිටියදී එම ස්ථානයේම රාජකාරි කරන ලද පො.ප. රත්නපාල නිලධාරියා සිදුකරන ලද ක්‍රියාකාරකමක් සැළකිල්ලට ගෙන එම සිද්ධිය විමර්ශනය කිරීම සඳහා නිලධාරීන් දෙදෙනාම ස්ථාන මාරු කළ බවයි. ඉන්පසුව පො.ප. රත්නපාල මහතා සම්බන්ධයෙන් මඩොල්සිම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා තමා වෙත ලිඛිතව දන්වා ඇත්තේ මෙම නිලධාරියා පො.කො. ලංකාධිකාර නිලධාරියා සමඟ දැඩි වෛරයෙන් සිටින බවත්, ඔවුන් අතර යම් ගැටළුවක් ඇති වීමට බොහෝ සෙයින් ඉඩ ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට දැනුම්දීමෙන් අනතුරුව ස්ථානාධිපති ලුණුගල විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව ද සැලකිල්ලට ගෙන ලංකාධිකාරි නිලධාරියාව එම නිලධාරියාගේම ආරක්ෂාව උදෙසා හාලිඇල පොලිස් ස්ථානය වෙත මාරුකිරීමට කටයුතු කළ බවයි. එසේ සිදුකරන ලද්දේ ස්ථානාධිපතිවරයාගේ වාර්තාව විශ්ලේෂණය කිරීමෙන් පසුවද තවදුරටත් එම කොට්ඨාශයේ මෙම නිලධාරීන් රඳවා ගැනීම තුළින් ඔවුන්ගේ ආරක්ෂාව සහ සෙසු නිලධාරීන්ගේ විනය පවත්වාගෙන යාම උදෙසා බවත්, ඒ අනුව නුවරඑළිය කොට්ඨාශයට හෝ හැටන් කොට්ඨාශයට ස්ථාන මාරු කරන ලෙසට තමා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත. තවද, මෙම නිලධාරියාගේ පැමිණිල්ල විමර්ශනය කිරීමේදී තමා විසින් හෝ සහකාර පොලිස් අධිකාරි රොෂාන් මහතාගෙන් හිතාමතා ප්‍රමාද කිරීමක් හෝ යටපත් කිරීමට උත්සාහ දැරීමක් සිදුකළ බවට කරන චෝදනා පිළි නොගන්නා බවත්, ඊට හේතුව ලංකාධිකාර නිලධාරියාගේ පැමිණිල්ල අනුව වගඋත්තරකාර පො.ප. රත්නපාල යන අයට විරුද්ධව මේවනවිටත් අධිකරණයේ නඩුවක් පවරා තිබීම බවත් දක්වා ඇත.

තවද, මෙම පැමිණිල්ලට අදාළව තමා විසින් නියෝජ්‍ය පොලිස්පති බදුල්ල දිසාව වෙත පො.ප. රත්නපාල නිලධාරියාගේ අයහපත් හැසිරීම සම්බන්ධයෙන් වාර්තා කළ බවත්, එම වාර්තාවේ මෙම පො.ප. රත්නපාල නිලධාරියා සමලිංගික සේවනයට දැඩි ලෙස ඇබ්බැහි වූ නිලධාරියෙක් බවට තමා වෙත වාර්තා වී තිබූ බවත්, මීට පෙරත් මැතිවරණ රාජකාරි සඳහා බඳවාගත් තරුණ කම්කරුවෙකුට අයුතු බලපෑම් කළ බවට පැමිණිල්ලක් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයා විසින් ඔහුට අවවාද කර ඇති බවත්, ස්ථානයේ තරුණ නිලධාරින්ට මෙම නිලධාරියා අයුතු බලපෑම් කර යෝජනා කරන බවට වාර්තා වී ඇති බැවින් මෙම නිලධාරියාගේ ක්‍රියාකලාපය හේතුවෙන් පොලිස් ස්ථානයේ විනය පවත්වාගෙන යාමට නොහැකි බැවින් මෙම පො.ප. රත්නපාල නිලධාරියාව වෙනත් ස්ථානයකට මාරු කිරීමට යෝජනා කර ඇති බවත්, එසේම බුද්ධි තොරතුරු මඟින් ද මෙම කරුණු වාර්තා වී ඇති බැවින්, තමා මෙම නිලධාරියා සම්බන්ධයෙන් අධ්‍යක්ෂක (මානව සම්පත් කළමනාකරණ) වෙත ද එම වාර්තාවේ පිටපතක් සහිත ලිපියක් යොමු කළ බවත් සඳහන් කර ඇත. එසේම, එම වාර්තාවේ මෙම පො.ප. රත්නපාල නිලධාරියාගේ අයහපත් හැසිරීම නිසා මහජනයා සමඟ සමීප සබඳතා නොදක්වන ස්ථානයකට මාරු කරන ලෙස ද සඳහන් කළ බව ප්‍රකාශ කර ඇත. එහි පිටපතක් ද කොමිෂන් සභාව වෙත ලබාදී ඇත.

මෙම කරුණු සම්බන්ධයෙන් පැමිණිලිකරු විමර්ශනයේදී සඳහන් කරනු ලැබුවේ මෙම ප්‍රකාශ සත්‍යතාවයෙන් තොර බවත්, 2018.05.23 වන දින හෝ ඒ ආසන්න දිනයකදී මඩොල්සිම පොලිස් ස්ථානාධිපති විසින් පොලිස් අධිකාරිවරයා වෙත ඉදිරිපත් කරන ලද ලිපියට අනුව තමාට හාලිඇල පොලිස් ස්ථානය වෙත ස්ථාන මාරුව ලබාදුන්නේ නම් එම ස්ථාන මාරුව 2018.07.06 දිනට පෙර ලබානොදීම ගැටළු සහගත වන බවයි.

තවද, පොලිස් අධිකාරිවරයා ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුට විරුද්ධව ලබාදී ඇති චෝදනා පත්‍රයට අදාළ විෂය වී ඇති කරුණ වන්නේ රාජකාරි පැහැර හැරීම හා විෂමාචාරයේ යෙදීම යටතේ ආයතන සංග්‍රහයේ 6 (3) සහ 6 (5) උපවගන්ති හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 2006.05.06 දිනැති අංක 1965/34 ගැසට් පත්‍රයේ පරිදි මෙම චෝදනා පත්‍රයේ චෝදනා 3 ක් සඳහන් කර ඇති අතර, එය විනය බලධාරියා ලෙස නියෝජ්‍ය පොලිස්පතිගේ අත්සනින් යුක්තව නිකුත් කර ඇති බවත්, එහි සියළු කරුණු ඇතුළත් වන බවත්, එම චෝදනා පත්‍රය නිලධාරියාගේ ඉහත සඳහන් කළ වැරදි එකක් හෝ කිහිපයක් හේතුවෙන් ලබාදී ඇති බවත් සඳහන් කර ඇත. ඒ සඳහා නිලධාරියාට තම නිවැරදිභාවය වෙනුවෙන් හෝ චෝදනාව පිළිගැනීම සම්බන්ධයෙන් චෝදනා පත්‍රය ලද පසු වාර්තා කිරීමට හැකියාව ඇති බවත්, කොමිෂන් සභාව විසින් තමාගෙන් විමසන කරුණට අදාළව මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන පො.කො. 83361 ලංකාධිර නිලධාරියා ඔහුට සිදුවූ බවට පවසන ලිංගික හිංසනය පිළිබඳ වන පැමිණිල්ල සම්බන්ධ විමර්ශනයට ප්‍රමාදයක් සිදුවීමෙන් ඔහුට අප්‍රතිකාරි තත්ත්වයක් ඇත්දැයි යන්න පිළිබඳව කොමිෂන් සභාව වෙත ලිඛිතව සැලකරන බවත් දන්වා ඇත.

කිසිදු ලෙසකින් වින්දිතයෙකුට විමර්ශනයේ ප්‍රමාදයක් හේතුවෙන් අධිකරණයේ විභාග වන නඩුවේදී අසාධාරණයකට ලක්වීමට අවස්ථාවක් නොමැති අතර, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 (1) යටතේ චෝදනා ගොනු කිරීම සඳහා සියළු සාක්ෂි විමර්ශන නිලධාරින් විසින් ප්‍රමාණවත් පරිදි රැස් කිරීමෙන් පසුව නඩු පැවරීම වාර්තා කරනු ලබන බවත්, මෙම නිලධාරි මහතාට සිදුවී ඇතැයි පැවසෙන ලිංගික හිංසනය සම්බන්ධයෙන් මේ වනවිට පස්සර සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 17508 යටතේ දැනට නඩුවක් ගොනු කර ඇති බවත්, එය ඉදිරියේදී විභාගය සඳහා කල් තබා ඇති බවත්, මෙම නඩු විභාගයේ චූදිත පුද්ගලයාට විරුද්ධව විමර්ශනයේදී පැමිණිලිකරුගේ සාක්ෂි ලබාදීමට හැකියාව ඇති බවත් සඳහන් කර ඇත.

ආයතන වලට තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් වන වරදකට පැමිණිලිකරුට ද්වේෂ සහගත ලෙස ස්ථාන මාරුවීමක් ලබාදුන්නේ යැයි ඉදිරිපත් කරන කරුණ සම්බන්ධයෙන් ඉහත වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ, චෝදනා පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ සම්මත ක්‍රමවේදයෙන් තොරව ආයතන චක්‍රලේඛන හා ආයතන නියෝග වලට පරිබාහිරව ක්‍රියාකිරීමෙන් අණට අකීකරු වීමක් සිදුව ඇති බැවින් බව ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිල්ල තුළ වගඋත්තරකරුවන්ට විරුද්ධව චෝදනා තුනක් ඉදිරිපත් වී ඇත. එනම්,

- පැමිණිලිකරුට පළවන වගඋත්තරකරු විසින් ලිංගික අඩම්තේට්ටම් කිරීම.
- එම ලිංගික හිරිහැර සම්බන්ධයෙන් උසස් නිලධාරින්ට කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීමට ප්‍රමාදවීම.
- පැමිණිලිකරු ඒ සම්බන්ධයෙන් වෙතන් ආයතන වලට පැමිණිලි කිරීම හේතුවෙන් ඔහුට ස්ථාන මාරු ලබාදීම.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම් වලට අනුව පළවන වගඋත්තරකරුට විරුද්ධව මේවනවිට පැමිණිලිකරුව ලිංගිකව අපයෝජනයට ලක්කිරීම සම්බන්ධයෙන් වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 17508 යටතේ නඩුවක් ගොනු කර ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පළවන වගඋත්තරකාර පො.ප. රත්නපාල මහතා විසින් මින් පෙර ද මෙවැනි අන්දමටම පොලිස් දෙපාර්තමේන්තුවට තාවකාලිකව බඳවාගෙන ඇති සේවකයන් දෙදෙනෙකුට ද ලිංගික හිරිහැර සිදුකර ඇති බවට නිරීක්ෂණය වේ.

පාර්ශවයන් දෙකටම ස්ථාන මාරු ලබාදී ඇති අතර, පළවන ස්ථාන මාරුව ලබාදීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් කරුණු දක්වා ඇත්තේ අදාළ පැමිණිල්ල විභාග කිරීමට සුදුසු පරිසරයක් ඇති කිරීම

සඳහා එම ස්ථාන මාරුව ලබාදුන් බවයි. පසුව කරන ලද ස්ථාන මාරුව සිදුකර ඇත්තේ පැමිණිලිකරුගේ ආරක්ෂාව සඳහා බවට කරුණු ඉදිරිපත් කර ඇත. එනම්, මඩොල්සිම ස්ථානාධිපතිවරයාගේ 2018.05.20 දින දරණ ලිපියට අනුව රත්නපාල නිලධාරියා පැමිණිලිකරු සමඟ කෝපයෙන් පසුවන බැවින් හා ඔවුන් එකම කොට්ඨාශයක සේවය කරන බැවින්, එය ගැටළුවක් වීමට ඉඩ ඇති බැවින් බව දක්වා ඇත.

පොලිස් අධිකාරිවරයා මෙම ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලට අදාළව නියෝජ්‍ය පොලිස්පති බදුල්ල දිසාව වෙත 2018.03.26 වන දිනැති ලිපිය මගින් පළවන වගඋත්තරකාර ජී.ඩී.රත්නපාල යන නිලධාරියාගේ අයහපත් හැසිරීම සම්බන්ධයෙන් කරුණු දක්වා ඇති අතර, මෙම නිලධාරියා සම ලිංගික සේවනයට දැඩි ලෙස ඇබ්බැහි වූ නිලධාරියෙක් බවට ස්ථානාධිපති ලුණුගල විසින් සහකාර පොලිස් අධිකාරි බදුල්ල II මගින් තමා වෙත වාර්තා කර ඇති බවත්, මැතිවරණ සමයේ මැතිවරණ කටයුතු සඳහා බඳවා ගන්නා ලද තරුණ කම්කරුවෙකුට ද අයුතු බලපෑම් සිදුකර ඇති බවට පැමිණිලි ලැබීමෙන් පසුව ස්ථානාධිපතිවරයා විසින් අවවාද කර ඇති බවත්, එසේම මෙම නිලධාරියාගේ ක්‍රියාකලාපය හේතුවෙන් පොලිස් ස්ථානයේ විනය පවත්වාගෙන යාමට නොහැකි බවත්, එමනිසා රත්නපාල නිලධාරියා වෙනත් ස්ථානයකට මාරු කිරීම සුදුසු බවත්, මෙම කරුණු තමාගේ බුද්ධි තොරතුරු මගින් තහවුරු වී ඇති බවත්, මේ බව තමා අධ්‍යක්ෂක (මානව සම්පත් කළමනාකරණ) වෙත ද දන්වා ඇති බව නිරීක්ෂණය වේ. එසේම, මෙම නිලධාරියාගේ ක්‍රියාකලාපය නිසා පොලිස් සේවයට ඉමහත් අපකීර්තියක් ඇති වන බැවින් මෙම මෙම නිලධාරියාව මහජනතාව සමඟ සම්බන්ධතා පවත්වාගෙන නොයන ක්‍රියාකාරි කොට්ඨාශයක් වෙත එනම්, වෛද්‍ය සේවා කොට්ඨාශය වෙත ස්ථාන මාරු කිරීම සුදුසු බවත් දන්වා ඇත. ඒ අනුව සහකාර පොලිස් අධිකාරිවරයා විසින් පැමිණිලිකරුගේ පැමිණිල්ල සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

මේවනවිට පැමිණිලිකරුට විරුද්ධව විනය පරික්ෂණයක් සඳහා චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර, එම චෝදනා අපකීර් දායක ලෙස හැසිරීම, අණට අකීකරුවීම සහ විශ්වාසය කඩ කිරීම යන චෝදනා වේ. නමුත්, පැමිණිල්ලේ සමස්ත කරුණු දෙස බලනකල මෙම චෝදනා පත්‍රය ලබාදීමට හේතු වූ ප්‍රධානම කරුණ ලෙස සැලකිය හැක්කේ පැමිණිලිකරුට සිදුවූ ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් පළ වූ වාර්තා ඔහු විසින්ම මාධ්‍යයට ප්‍රසි ධ කිරීම යන කරුණ මත බවට නිරීක්ෂණය වේ.

නිගමනය :-

පළවන වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය පැමිණිලිකරුට ලිංගික අපයෝජනයක් සඳහා බලපෑම් කළ බව හෙළිදරව් වන බැවින්, තරුණ පොලිස් නිලධාරියෙක් වන පැමිණිලිකරුට මානසික හිංසනයක් සහ මානසික පීඩනයක් ඇති කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව පළවන වගඋත්තරකරු විසින් කඩ කර ඇති බවට තහවුරු වන අතර, මෙම වගඋත්තරකරුට එරෙහිව මේවනවිට අධිකරණයේ අපරාධ නඩුවක් විභාග වීම තුළින්ද එය තවදුරටත් ත්වර වේ.

පැමිණිලිකරුගේ ස්ථාන මාරුවීම තුළින් පැමිණිලිකරු යම් අපහසුතාවයකට පත්වී ඇත. නමුත් වගඋත්තරකරුවන් එම ස්ථාන මාරුව ලබාදී ඇත්තේ මෙම පැමිණිල්ල විභාග කිරීම පහසුවීම සඳහාත්, පැමිණිලිකරුගේ ආරක්ෂාව සඳහාත් බවට ඉදිරිපත් කරන කරුණු බැහැර කළ නොහැක.

පැමිණිලිකරුට පළවන වගඋත්තරකරුගෙන් සිදුවූ හිංසන ක්‍රියා සලකා බලනවිට ඒ සම්බන්ධයෙන් අනෙක් වගඋත්තරකරුවන් වෙත පැමිණිලි කිරීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට යම් කාලයක් ගත වීම තුළින් පැමිණිලිකරුට මානසික පීඩනයක් ඇති විය හැක. නමුත්, පැමිණිලිකරු විසින්ම මෙම සිද්ධිය මාධ්‍යය වලට හෙළිදරව් කලේද යන්න පිළිබඳව සාක්ෂි මඟින් හෙළිදරව් වී නැත. කෙසේ වෙතත්, ඉහළ නිලධාරියෙකුගෙන් මෙවැනි ක්‍රියාවක් කිසිදු අවස්ථාවක අනුමත කළ නොහැකි බැවින් ද, එවැනි ක්‍රියාවන් තුළින් තවත් නිලධාරියෙකු අපහසුතාවයට පත්වීම වැළැක්වීම සහ එවැනි ක්‍රියා ඉදිරියට වැළැක්වීම සඳහා ද දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් මේ සම්බන්ධයෙන් අවබෝධයක් ඇති කිරීම සඳහාත් ජනමාධ්‍යය තුළින් මෙම සිද්ධිය ප්‍රචාරය වීමෙන් සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවම අපකීර්තියට පත්වූ බවට ඉදිරිපත් කරන මතය කොමිෂන් සභාව පිළිනොගන්නා බවත්, යම් නිලධාරියෙකුට අකටයුත්තක් අසාධාරණයක් සිදුවූ විට සහන පැතීම සඳහා වෙනත් ආයතනයකට පැමිණිලි කිරීමේ සම්පූර්ණ අයිතිය ඔහු සතු වේ. එවැනි පැමිණිලි කිරීමක් තුළින් සහ මේ පිළිබඳ ජනමාධ්‍යය වල ප්‍රචාරය වූවාය යන කරුණ මත එම නිලධාරියා සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වීම අනුමත කළ නොහැක. මේ ආකාරයෙන් විනය පරීක්ෂණ සිදුකිරීම මඟින් මෙවැනි දූෂිත ක්‍රියාවන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම අධෛර්යමත් කරන බව කොමිෂන් සභාවේ මතය වේ. දූෂිත ආකාරයෙන් කටයුතු කරන නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි කිරීම සහ ඔවුන් පිළිබඳව දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ගය තවදුරටත් පුළුල් කළ යුතු බව කොමිෂන් සභාවේ හැඟීම වේ.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක <u>පී.එස්.මනෝරි පැල්කැටිය එරෙහිව එච්.එම්.ගුණසේකර ඇතුළු පිරිස</u> **<u>SCFR 76/2012</u>** නඩුවේදී ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කර ඇත්තේ, සිද්ධියට අදාළ සියළු කටයුතු සලකා බලනවිට පැමිණිලිකරුගේ 12 (1) ව්‍යවස්ථාව සහ 14 (1) (අ) ව්‍යවස්ථාව මඟින් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම් කඩකර ඇති බවයි. ගරු ශේෂ්ඨාධිකරණයේ ස්ථාවරය වී ඇත්තේ <u>පෙත්සම්කාරිය විසින් මධ්‍යයකට සම්මුඛ සාකච්ඡාවක් ලබාදීම මත ඇයගේ අදහස් විකාශනය වීම තුළින් පැමිණිලිකාරිය ආයතනය සංග්‍රහයට පටහැනිව කටයුතු කර නැති බවයි</u>. එසේම ගරු ශේෂ්ඨාධිකරණය තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, පෙත්සම්කාරියට සිදුවන හිංසන ක්‍රියා බලධාරීන් අවබෝධ කර ගැනීමට අපොහොසත් වීම වැනි කල්ක්‍රියාවන් කිසිවිටෙක අනුමත කළ නොහැකි බවයි.

කෙසේ වෙතත්, පැමිණිලිකරුට ලිංගික හිරිහැරයක් සිදුව ඇති බවට කරුණු සනාථ වන බැවින්, එවැනි ක්‍රියාවකට එරෙහිව පැමිණිලි කිරීම තුළින් පැමිණිලිකරුට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කිරීම මඟින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවීය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව මෙවැනි ක්‍රියාවන්ට එරෙහිව පැමිණිලි කිරීම මත අදාළ පැමිණිල්ල ඉදිරිපත් කරන්නා සම්බන්ධයෙන් විනය පියවර ගැනීම තුළින් උසස් නිලධාරින්ගේ මෙවැනි ක්‍රියා සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට පහළ නිලධාරින් අධෛර්යමත් වන බැවින් පැමිණිලිකරුගේ විනය පරීක්ෂණය සම්බන්ධයෙන් නැවත සලකා බලන ලෙසට පොලිස්පතිවරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021. 06. 30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති.
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

B/